# මීගමුව අධ්‍යාපන කලාපය

# දෙවන වාර ඇගයීම 2025

## බුද්ධ ධර්මය

## 7 ශ්‍රේණිය

**කාලය පැය 2** **නම/විභාග අංකය ......................................**

පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
දෙවන කොටසේ පළවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

**<u>පළමු කොටස</u>**

- අංක 1 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) සම්බුද්ධත්වයෙන් අනතුරුව ලෝක සත්ත්වයාගේ හිත සුව පිණිස දහම් දෙසීම සඳහා බුදුරජාණන් වහන්සේට ආරාධනා කරනු ලැබුයේ,

   1. සහම්පති මහා බ්‍රහ්මයා ය.
   2. ශක්‍රදේවේන්ද්‍රයා ය.
   3. සටීකාර බ්‍රහ්මයා ය.
   4. සතර වරම් දෙවිවරුය.

2) බුදුරදුන්ගේ පළමු ලංකා ගමනය සිදු වූයේ,

   1. කැලණියට ය
   2. මහියංගනයට ය
   3. නාගදීපයට ය
   4. දීඝවාපියට ය

3) බුදුන් දහම් සරණගිය පළමු උපාසකවරු වන්නේ,

   1. තපස්සු හා හල්ලුක ය
   2. ආලාර කාලාම හා උද්දකරාමපුත්ත ය.
   3. නදී හා ගයා කාශ්‍යප ය
   4. උපතිස්ස හා කෝලිත ය

4) නව අරහාදී බුදුගුණ අතරට අයත් නොවන්නේ,

   1. අරහං ය.
   2. සුගත ය.
   3. ලෝකවිදූ ය.
   4. ඕපනයිකය.

5) බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දූත පිරිස,

   1. 50 නමකි.
   2. 51 නමකි.
   3. 60 නමකි.
   4. 61 නමකි.

6) බුදුරජාණන් වහන්සේගෙන් ගිලානෝපස්ථානය ලද භික්ෂූන් වහන්සේ නමක් වන්නේ,

   1. ආනන්ද තෙරුන්ය.
   2. පූතිගත්ත තිස්ස තෙරුන්ය
   3. අනුරුද්ධ තෙරුන්ය
   4. කාශ්‍යප තෙරුන්ය

7) උපතිස්ස හා කෝලිත දෙදෙනා බුද්ධ ශ්‍රාවකයන් බවට පත්වීමට පෙර ඔවුන්ගේ ගුරුවරයා වූයේ,

   1. භාර්ගව තවුසාය.
   2. සකුළුදායි පිරිවැජියාය
   3. පොට්ඨපාද පිරිවැජියාය.
   4. සංජය පිරිවැජියාය.

8) කරණීය මෙත්ත සූත්‍රයේ මෙත් වැඩිය යුතු සියලු සත්ත්වයින් අතර "භූතා "ලෙස හඳුන්වන්නේ,

   1. දුර වසන සත්වයෝය.
   2. ළඟ වසන සත්වයෝය.
   3. උපන් සත්වයෝය.
   4. උපතක් සොයන සත්වයෝය.

9) තුන් සූත්‍රයට අයත් නොවන්නේ,

1. මංගල සූත්‍රය
2. රතන සූත්‍රය
3. කරණීය මෙත්ත සූත්‍රය
4. වසල සූත්‍රය

10) බෞද්ධයාගේ අත්පොත ලෙස හඳුන්වනු ලබන්නේ,

1. ධම්මපදයයි
2. ත්‍රිපිටකයයි.
3. පිරිත් පොතයි
4. ජාතක කතා පොතයි.

11) නිත්‍ය ශීලය, ගෘහස්ථ ශීලය යන නම් වලින් හැඳින්වෙන්නේ,

1. පංච සීලයයි
2. දස සීලයයි
3. අෂ්ටාංග උපෝසථ සීලය යි
4. ආජීව අෂ්ටමක සීලයයි

12) බුදුරජාණන් වහන්සේට ජේතවනාරාමය පූජා කළේ,

1. බිම්බිසාර රජතුමා
2. සුද්ධෝදන රජතුමා
3. අනේපිඬු සිටුතුමා
4. විශාඛා සිටුදේවිය

13) බුදු දහම පටිසෝතගාමී දහමක් වේ. එහි තේරුම වන්නේ බුදු දහම,

1. උඩුගම් බලා යාමට මග පෙන්වන දහමක් බවයි
2. යටිගං බලා යාමට මග පෙන්වන දහමක් බවයි
3. ඉදිරිය බලා යාමට මග පෙන්වන දහමක් බවයි
4. දකුණත බලා යාමට මග පෙන්වන දහමක් බවයි

14) බුදුන් වහන්සේ සතු වූ දමනය කළ නොහැකි පුද්ගලයන් දමනය කිරීමේ හැකියාව හඳුන්වන්නේ,

1. සම්මා සම්බුද්ධ ලෙසයි
2. අනුත්තර පුරිසධම්ම සාරථී ලෙසයි
3. සුගත ලෙසයි
4. ලෝක විදූ ලෙසයි

15) සිඟාලෝවාද සූත්‍රයේ දී දකුණු දිශාවට උපමා කොට ඇත්තේ,

1. දෙමාපියන්ය
2. ගුරුවරුන්ය
3. හිත මිතුරන්ය
4. වැඩිහිටියන්ය

16) සිරිත් මල්දම රචනා කරන ලද්දේ,

1. ඇම්.ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමා විසිනි
2. තොටගමුවේ රාහුල හිමියන් විසිනි
3. වීදාගම මෛත්‍රී හිමියන් විසිනි
4. එස්. මහින්ද හිමියන් විසිනි

17) ගොවිතැනින් ලබාගන්නා අස්වැන්නේ පළමු කොටස ත්‍රිවිධ රත්නයට පූජා කිරීම හැඳින්වෙන්නේ,

1. සාංඝික දානය
2. ජේරු දානය
3. අග්‍රශෂ්‍ය දානය
4. දේව දානය

18) ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ඉටු කළ යුතු යුතුකමක් නොවන්නේ,

1. මැනවින් ඉගැන්වීම.
2. හොඳින් ඉගෙනීම.
3. මැනවින් හික්මවීම
4. සියලුම ශිල්ප ඉගැන්වීම

19) අප මහා බෝසතාණන් වහන්සේ ඛන්ති පාරමිතාව ප්‍රගුණ කළ අයුරු දැක්වෙන ජාතක කතාව වන්නේ,

1. වෙස්සන්තර ජාතකයයි.
2. මඛාදේව ජාතකයයි.
3. ක්ෂාන්තිවාදී ජාතකයයි
4. මහා කපි ජාතකයයි

20) බොදු දරුවෙකු තුළ දක්නට නොලැබෙන ලක්ෂණයක් වන්නේ,

1. භික්ෂු නායකත්වය නොපිළිගැනීම
2. කළගුණ සැලකීමයි
3. ආගන්තුක සත්කාර
4. වැඩිහිටියන්ට ගරු කිරීමයි

## <u>දෙවන කොටස</u>

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. ඔබ පන්තියේ බුද්ධ ධර්මය විෂයට අදාළව දෙවන වාරයේ සිදුකළ භූමිකා රංගනය ඇගයීමට අදාලව පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න

    I. මෙම ඇගයීම සිදුකළ පාඩමේ නම කුමක්ද?
    II. ඇගයීම සිදුකිරීමට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න.
    III. ඇගයීම සිදුකිරීම නිසා ඔබට ලැබුණු කුසලතා දෙකක් ලියන්න.
    IV. ඇගයීම සිදුකිරීමේදී ඔබ මුහුණ දුන් ගැටළු දෙකක් ලියන්න.
    V. නායකයකු සතු ලක්ෂණ දෙකක් ලියන්න.
    VI. පන්ති කාමරයේ නායකයෙකු ලෙස කටයුතු කිරීමේදී, ඔබ මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න.
    VII. පන්සිය පනස් ජාතක පොත රචනා කළ යුගය නම් කරන්න.
    VIII. අනුවණ නායකයෙකු නිසා තම පිරිසට විය හැකි කරදර මොනවාද?
    IX. 'සාත්තු නායකයා 'යන්නෙහි අදහස කුමක්ද?
    X. මෙම ඇගයීම තුළින් ඔබ ලැබූ අත්දැකීම් දෙකක් සඳහන් කරන්න.

2. 

    i. ධම්මපදය අයත් වන්නේ කුමන නිකායටද?
    ii. වෛරයෙන් වෛරය නොසන්සිඳෙන බව කියැවෙන ධම්මපද ගාථාව ලියන්න.
    iii. මෛත්‍රී සහගතව කටයුතු කිරීමෙන් ඔබට සැලසෙන යහපත් දේවල් පහක් ලියන්න

3. 

    i. බුදුරජාණන් වහන්සේ අසරණයන්ට පිහිට වූ අවස්ථා දෙකක් ලියන්න.
    ii. උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් ලියන්න
    iii. බොදු දරුවකු ලෙස ඔබට අසරණයන්ට පිහිට විය හැකි අවස්ථා පහක් ලියන්න

4. 

    i. විරමණය හා සමාදානය යන්න පැහැදිලි කරන්න.
    ii. පන්සිල් පදවලින් පළමු ශික්ෂා පද තුන පිළිවෙලින් නම් කරන්න.
    iii. පන්සිල් සුරැකීම නිසා සමාජයට සිදුවන යහපත පැහැදිලි කරන්න.

5. 

    i. ඉවසීම ප්‍රගුණ කිරීමෙන් බුදුරජාණන් වහන්සේගේ පැසසුමට ලක් වූ හිමිනම කවුරුන්ද?
    ii. ඉවසීම නොමැතිකම නිසා මිනිසාට අත්විඳීමට සිදුව ඇති දුර්විපාක තුනක් ලියන්න
    iii. ඉවසීමෙන් ලැබෙන ආනිශංස පහ ලියා දක්වන්න.

6.

i. සහජීවනය යනු කුමක්ද?
ii. සිව් බඹ විහරණ වලින් තුනක් නම් කරන්න.
iii. සහජීවනයෙන් කටයුතු කිරීම නිසා ඔබට ලැබෙන ප්‍රයෝජන මොනවාද?

7. පහත මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. බුදුගුණ
ii. වැඩිහිටියන්ට සැලකීම
iii. පන්සලේදී අනුගමනය කළ යුතු සිරිත් විරිත්
iv. විශාකා සිටු දියණිය